# පර්යේෂණ මාතෘකාව හා ගැටලුව තෝරා ගැනීම

- එච්. එම්. සමරකෝන් බණ්ඩා

**ප්‍රවේශය**

කිසියම් විද්‍යාත්මක පර්යේෂණ කාර්යයකට පිවිසෙන ආධුනික පර්යේෂකයෙක් මුහුණ දෙන ප්‍රබලතම ගැටලුවක් ලෙස පර්යේෂණ මාතෘකාවක් (Research Topic) තෝරාගැනීම සඳහන් කළ හැකිය. බොහෝ පර්යේෂකයින් පර්යේෂණ මාතෘකාවක් තෝරා ගැනීමට නොහැකිව ඒ සඳහා දිගු කාලයක් ගත කරන අතර විවිධ මානසික ආතතීන්ට ද මුහුණදෙයි. මේ අතර ඇතැම්විට පර්යේෂණ කල් දමන පර්යේෂණ අතර මැද අතහැර දමන, නිතර නිතර මාතෘකා මාරුකරන පිරිස් බහුලව දැකිය හැකිය. එමෙන්ම උසස් උපාධි කමිටුවල අනුමැතිය ලබා ගැනීමට සුදුසු පරිදි මාතෘකාව නිවැරදිව සකස් කිරීමේ කුසලතාව ද අඩු වීමෙන්, විවිධ ගැටලුවලට මුහුණදෙයි. මෙයින් පැහැදිලි වන්නේ පර්යේෂණ කාර්යයේ දී මුහුණදෙන ප්‍රධානතම හා අපහසුම කාර්ය වන්නේ පර්යේෂණ ගැටලුව තෝරා ගැනීම හා පර්යේෂණ මාතෘකාව සකස්කර ගැනීමයි. මේ පිළිබඳව අදහස් දක්වන මෞලි පෙන්වා දෙන්නේ මාතෘකාවක් තෝරාගැනීම සඳහා පර්යේෂණයකට පිවිසෙන්නෙකුට සැලකිය යුතු අත්දැකීම් සමූහයක් තිබිය යුතු බවයි (Mouly,1978( 36 - 41).

ඉහත තත්වය සැලකිල්ලට ගෙන මෙම ලිපියෙන් අවධාරණය කරන්නේ විද්‍යාත්මක පර්යේෂණයක් සඳහා පර්යේෂණ මාතෘකාවක් තෝරාගැනීමේ දී සැලකිය යුතු ක්‍රියා පිළිවෙත සාකච්ඡාවට භාජනය කිරීමය. සමාජීය විද්‍යා පර්යේෂණ ක්ෂේත්‍රයේ පර්යේෂණ ගැටලුවක් හඳුනාගැනීම එතරම් අපහසු කාර්යයක් නොවේ. ඊට හේතුව සමාජ ක්‍රියාවලිය තුළ අප්‍රමාණ ගැටලු පවතින බව පර්යේෂණ මනසකින් විමසා බලන විට පෙනී යන හෙයිනි. එනම්, අධ්‍යයනයට භාජනය කරමින් සත්‍ය (Truth) හා යථාර්ථය (Reality) සෙවිය හැකි ගැටලු රාශියක් අප අවට බෙහෙවින් දක්නට ලැබෙන බවයි. උදාහරණ වශයෙන් ගතහොත් මත්ද්‍රව්‍ය උවදුර, ආතතිජනක ළමුන්, ඉගෙනීමට

නොපෙළඹෙන ළමුන්, කලහකාරි දරුවන්, සෙමින් ඉගෙන ගන්නා දරුවන්, අපචාරී දරුවන්, දේව විශ්වාස, මිථ්‍යා ඇදහිලි, දික්කසාද ගැටලු, පාරිභෝගික හැසිරීම, චිත්තවේගී ගැටලු, පාසල් හැරයාම, ගුරුභූමිකාව, ස්ත්‍රී පුරුෂ සමාජ භාවය පිළිබඳ ගැටලු, ගුරු - ශිෂ්‍ය සබඳතා පිළිබඳ ගැටලු, ලිවීම, කියවීම, කතා කිරීම, සවන්දීම පිළිබඳ ගැටලු හුදෙකලා ළමුන්, අපරාධකාරී චර්යා, පරිසර දූෂණය, ආහාර හා රසායනික භාවිතය ආදී විවිධ ගැටලු පවතින බව පෙනී යයි. මේ අනුව පර්යේෂණ ශක්‍යතා හඳුනාගෙන, ගැටලු ක්ෂේත්‍රය තුළ විෂයක්ෂේත්‍රයට ගැළපෙන ගැටලුවක් ඔස්සේ මාතෘකාවක් සකස් කර ගැනීම පර්යේෂකයෙකු විසින් කළ යුතුය. මේ පිළිබඳව පර්යේෂකයෙකු විසින් සැලකිල්ලට ගතයුතු කරුණු මොනවාදැයි තවදුරටත් විමසා බැලීම වැදගත් ය.

**පර්යේෂණ මාතෘකාව හා පර්යේෂණ ශක්‍යතාව**

පර්යේෂකයෙක් සිය පර්යේෂණ මාතෘකාව තෝරාගත යුත්තේ තමන්ගේ පර්යේෂණ ශක්‍යතාව සැලකිල්ලට ගෙනය. එනම්, සමහර පර්යේෂකයින් මාතෘකා තෝරාගත්තත් ඒවා විද්‍යාත්මක අවසන් පර්යේෂණයක් වශයෙන් නිමාවට පත් කිරීමට අසමත් වේ. ඊට හේතු සාධකයක් වී ඇත්තේ ඔවුන්ගේ පර්යේෂණ හැකියාව පිළිබඳ ඇති වී තිබෙන විවිධ ගැටලු සහගත තත්වයන්ය. එම නිසා පර්යේෂණ මාතෘකාවක් තෝරාගැනීමේ දී පර්යේෂණ ශක්‍යතාව පිළිබඳ අවබෝධයෙන් සිටීම වැදගත් වේ.

මෙම පර්යේෂණ ශක්‍යතාව සහ පර්යේෂණ මාතෘකා තෝරාගැනීම අතර ඇත්තේ ප්‍රබල සම්බන්ධතාවකි. පර්යේෂණ ශක්‍යතාව අනුව පර්යේෂණ මාතෘකාවක් තෝරාගැනීම පර්යේෂණයේ සාර්ථකත්වයට හේතු වන අතර එවැනි හැකියාවකට නොගැළපෙන මාතෘකා තෝරාගැනීම පර්යේෂණයේ අසාර්ථකත්වයට හේතු වේ. මේ අනුව පර්යේෂකයෙකුගේ පර්යේෂණ ශක්‍යතාව අනුව මාතෘකා තෝරා ගැනීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කිරීම වැදගත් වේ.

1. තමාගේ විෂය ක්ෂේත්‍රයට ගැළපෙන මාතෘකාවක් තෝරා ගැනීම
2. තමාගේ තාක්ෂණික හා ශිල්පීය කුසලතාවලට ගැළපෙන මාතෘකාවක් තෝරා ගැනීම
3. පර්යේෂකයාගේ ආර්ථික ශක්තියට ගැළපෙන මාතෘකාවක් තෝරාගැනීම
4. පර්යේෂකයාගේ සමාජ කුසලතා හා අන්තර් සබඳතා පිළිබඳ සැලකිල්ලෙන් මාතෘකාවක් තෝරාගැනීම
5. පර්යේෂකයාගේ භාෂා ග්‍රහණයට ගැළපෙන මාතෘකාවක් තෝරාගැනීම
6. පර්යේෂකයාගේ සංස්කෘතික තත්වය සැලකිල්ලට ගෙන මාතෘකාවක් තෝරාගැනීම
7. පර්යේෂකයාගේ සෞඛ්‍ය තත්ත්වයට ගැළපෙන මාතෘකාවක් තෝරා ගැනීම
8. වැඩි අවදානම් සහිත ප්‍රදේශයක් හෝ සමාජ කණ්ඩායමක් නියෝජනය කරන මාතෘකාවක් තෝරා ගැනීම
9. පර්යේෂකයාගේ ස්ත්‍රී/පුරුෂ සමාජභාවය සැලකිල්ලට ගෙන මාතෘකාවක් තෝරාගැනීම
10. දත්ත ලබාගැනීමේ හැකියාව සහ විශ්ලේෂණය කිරීමේ හැකියාව සැලකිල්ලට ගෙන ද මාතෘකාවක් තෝරා ගැනීම
11. පර්යේෂකයාගේ පෞද්ගලික ජීවිතය, පහසුකම්, තර්කන හැකියා හා ගැටලු අනුව මතෘකාවක් තෝරා ගැනීම
12. පර්යේෂකයාට ලැබෙන ප්‍රතිලාභ සැලකිල්ලට ගෙන පර්යේෂණ මාතෘකාව තීරණය කිරීම
13. දී තිබෙන කාලයට ගැළපෙන මාතෘකාවක් තෝරාගැනීම
14. අතිශයින්ම සංකීර්ණ හා පුළුල් මාතෘකාවක් තෝරා නොගැනීම (ධම්මපාල හිමි, 1988 :32)

බොහෝ පර්යේෂකයෝ ස්වකීය පර්යේෂණ අතරමැද නතර කරති. මීට හේතු පරීක්ෂා කිරීමේදී ඔවුන් පවසන හේතු සාධක රාශියකි. එනම්, වියදම් කළ නොහැකි වීම, දත්ත එකතු කිරීම හා විශ්ලේෂණ හැකියාව අඩුකම, කාලය ප්‍රමාණවත් නොවීම, පෞද්ගලික ජීවිතයේ වැඩ අධික වීම, පර්යේෂණ භූමියේ දී ඇතිවන අවදානම, විවිධ භාෂාමය ගැටලු, පර්යේෂණ භූමියෙහි සංස්කෘතික පරිසරය

දුර්වල වීම, පර්යේෂණ මාතෘකාවට අකමැති වීම, අතෘප්තිය, ආතතිය හා නොපෙළඹීම, දරුවන්ගේ ගැටලු, පවුලේ ගැටලු, තාක්ෂණික දැනුමේ පවතින අඩුපාඩු ආදී විවිධ හේතු සාධක ඉදිරිපත් කරයි. මේ සියල්ලෙන්ම පැහැදිලි වන්නේ තමාට අදාළ පර්යේෂණ හැකියාව සැලකිල්ලට නොගෙන මාතෘකාව තෝරා ගැනීමයි. එම නිසා පර්යේෂකයෙක් කිසියම් මාතෘකාවක් තෝරා ගැනීමේ දී ස්වකීය පර්යේෂණ ශක්‍යතාව පිළිබඳ මනා අවබෝධයෙන් සිටීම බෙහෙවින්ම වැදගත් වේ.

**පර්යේෂණ මාතෘකාව හා එහි වැදගත්කම**

පර්යේෂණ ගැටලුවක් තෝරා ගැනීමේ දී සලකා බැලිය යුතු සුවිශේෂි සාධකයක් ලෙස සැලකිය හැක්කේ එහි ඇති වැදගත්කමයි. මේ පිළිබඳව අදහස් දක්වන බර්ජර් ( Berger) පෙන්වා දෙන පරිදි (Importance of the Research Problem) පර්යේෂණ ගැටලුවේ වැදගත්කම කෙරෙහි අවධානය යොමු කිරීම පර්යේෂකයාගේ ප්‍රමුඛ වගකීමක් වේ. එනම්, පවතින සමාජයේ ගැටලුවක් විසඳීමට මගපෙන්වීම, පවතින දැනුමට අලුත් දැනුමක් එකතු කිරීම, මිථ්‍යා අදහසක් ඉවත් කිරීම ආදී කවර ආකාරයකින් හෝ පුළුල් වැදගත්කමක් සහිත ගැටලුවක් තෝරා ගැනීම බෙහෙවින්ම වැදගත් වේ. පර්යේෂණ මාතෘකාව තෝරන අවස්ථාවේදී ම එහි වැදගත්කම පිළිබඳව පර්යේෂකයා සිය අවධානය (should also be the consideration of the researcher while selecting a research topic) යොමු කිරීම අවශ්‍ය වේ. ඒ අනුව පර්යේෂණ මාතෘකාව තත්කාලීන වැදගත්කමකින් (The topic should have current impotence) යුක්ත විය යුතුය. එමෙන් ම අධ්‍යයන ක්ෂේත්‍රයට කවර ආකාරයෙන් මාතෘකාව වැදගත් වන්නේ දැයි (You should also assess how much the topic will provide benefit to the field in which you are conducting the study) තක්සේරු කළ යුතුය. ඒ අනුව පර්යේෂණ මාතෘකාවක වැදගත්කම පහත සඳහන් සාධක අනුව තීරණය වන බව වැඩිදුරටත් පෙන්වාදිය හැකිය.

1. සමාජයට ප්‍රබල සංවේදිතාවක් පවතින ගැටලුවක් පිළිබඳ අධ්‍යයනය කිරීම

උදාහරණ වශයෙන් මත්ද්‍රව්‍ය භාවිතය, සියදිවි නසා ගැනීම, රසායනික පොහොර භාවිතය, නායකත්වය, පරිසර දූෂණය ආදී ගැටලු පිළිබඳව අවධානය යොමු කිරීම

2. සමස්ත සමාජයටම සාමාන්‍යකරණය කළ හැකි ගැටලුවක් පිළිබඳ අධ්‍යයනය කිරීම

   මෙයින් අදහස් කරන්නේ ගැටලුව අධ්‍යයනය කිරීමේ ප්‍රතිඵලය සමාජයේ බොහෝ පිරිසකට හෝ වැදගත් විය හැකි වීමයි.

3. ගැටලුවකට ලබාදෙන විසඳුම දිගුකාලීන වීම

   මෙයින් අදහස් කරන්නේ පර්යේෂකයා අධ්‍යයනය කරන මාතෘකාව ඇසුරෙන් ලබා ගන්නා විසඳුම් දිනකට දෙකකට, කෙටි කාලීනව පටු දෙයකට වඩා දිගු කාලයකට බල පැවැත්වීම පර්යේෂණ මාතෘකාවේ වැදගත්කම තීරණය කිරීමට හේතු වන බවයි.

4. පවතින දැනුමට අලුත් දැනුමක් එකතු කිරීම

   පර්යේෂණයකින් යම් විෂය ක්ෂේත්‍රයක් පිළිබඳ පවතින දැනුමේ අඩුපාඩුවක් තිබිය හැකිය. එමෙන් ම වැරදි මිත්‍යා අදහස් තිබිය හැකිය. එවැනි දැනුම් සම්භාරයක් නිවැරදි කිරීම, ඉදිරියට ගෙන යාම අලුත් න්‍යායයක් සැකසීම පර්යේෂණයක වැදගත්කම පෙන්නුම් කෙරේ.

5. ප්‍රතිපත්ති සම්පාදනයට මග පෙන්වීම

   උදාහරණ වශයෙන් "අට වසර ළමුන්ගේ විෂයමාලාවේ ස්වභාවය" අධ්‍යයනය කරනවාට වඩා "අට වසර ළමුන්ගේ විෂයමාලාවෙන් වෘත්තීයමය කුසලතා සංවර්ධනය කිරීම පිළිබඳ අධ්‍යයනයක්" යන මාතෘකාව බෙහෙවින්ම වැදගත්ය. එය ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ බලාපොරොත්තු සඵල කරන වැදගත්කමක් පෙන්නුම් කරයි. මෙලෙස පර්යේෂකයෙක් තමා තෝරාගන්නා

මාතෘකාව කවර මාතෘකාවකට වැදගත්කමක් ඇත්දැයි හොඳින් පිරික්සා බැලීම අවශ්‍ය වේ.

## දත්ත ලබා ගැනීමේ හැකියාව

විද්‍යාත්මක පර්යේෂණයකට උචිත මාතෘකාවක් තෝරා ගැනීමේ දී සලකා බැලිය යුතු තවත් වැදගත් කරුණක් වන්නේ ගැටලුවට අදාළ පර්යේෂණ දත්ත ලබා ගැනීමේ හැකියාව පිළිබඳ විමසා බැලීමයි. බොහෝ පර්යේෂකයින් තමන්ගේ අභිරුචිය මත කිසියම් මාතෘකාවක් තෝරා ගත්තත් ඊට අදාළ දත්ත ලබා ගැනීමේ දී අදාළ දත්ත ලබාගත නොහැකි වීමෙන් ඔවුන් දුෂ්කරතාවලට මුහුණ දී පර්යේෂණය අතහැර දමයි. එසේත් නැතිනම් මෙම ගැටලුව නිසාම මාතෘකා වෙනස් කරමින් කාලය නාස්ති කරයි. මේ නිසා ස්වකීය පර්යේෂණ මාතෘකාව කොතරම් වැදගත් වුව ද, සංවේදී වුව ද, සමාජීය අදාළත්වය ඉහළ මට්ටමක පැවතිය ද පර්යේෂණ දත්ත ලබා ගැනීම අපහසු නම් මාතෘකා වෙනස් කිරීම ප්‍රඥාගෝචර වේ. එසේම පර්යේෂණ මාතෘකාවට අදාළ දත්ත ලබා ගැනීම වඩාත් දුෂ්කර වී, ප්‍රමාණවත් දත්ත නොලැබුණොත් එවැනි මාතෘකාවක් අතහැර දමා අලුතෙන් තවත් මාතෘකාවක් ආරම්භ කිරීම වඩාත් සුදුසු බව මේ පිළිබඳව අදහස් දක්වන බර්ට් (Bart,1997) වැඩිදුරටත් පෙන්වාදෙයි. එහෙත් බොහෝ විද්‍යාර්ථීහු ස්වකීය පර්යේෂණයට අදාළ දත්ත ප්‍රමාණය නොතිබිය දී වුවත් මාතෘකාව වෙනස් කිරීමට අකමැත්තක් දක්වති. ඒ අතරම ව්‍යාජ දත්ත, යල්පැනගිය දත්ත, අදාළ නොවන දත්ත හෝ මනඃකල්පිත දත්ත විශ්ලේෂණය කිරීමට පෙළඹෙති. මේ නිසා සිදුවන්නේ පර්යේෂණයේ විද්‍යාත්මක බව පිරිහී ගොස්, තර්කානුකූල බව හා යථාර්ථවත් බවින් තොර නිශ්ඵල ප්‍රයත්නයක් බවට පත්වීමයි. එම නිසා ඕනෑම පර්යේෂකයෙක් ස්වකීය පර්යේෂණ මාතෘකාව තෝරාගත යුත්තේ ඊට අදාළ දත්ත ලබා ගැනීමේ හැකියාව ද සැලකිල්ලට ගැනීමෙනි.

**පැහැදිලි පර්යේෂණ ගැටලුවක් තිබීම**

විද්‍යාත්මක පර්යේෂණයක වැදගත්ම ගුණාංගය වන්නේ, පර්යේෂණ මාතෘකාව හා ගැටලුව ඉතා පැහැදිලි වීමයි. එය පැහැදිලි වන තරමට අනෙක් අයට පර්යේෂණය අවබෝධ කරගත හැකි බව (The topic should be clean so that others easily unearth the nature of research) පිළිගැනීමයි. විශේෂයෙන්ම පර්යේෂකයාගේ මනසට මෙම මාතෘකාව පැහැදිලි විය යුතුයි. එසේ නොවුණහොත් ඔහුට පර්යේෂණයේ මූලික ගැටලුව විග්‍රහ කරගත (interpretation of the research problem) නොහැකිය. පර්යේෂණ ප්‍රශ්න (research questions) ගොඩනගා ගැනීම දුෂ්කර වේ. එමෙන්ම පර්යේෂණයේ අරමුණු (aims of the research) පර්යේෂණ ක්‍රමවේදය (research methodology) දුර්වල තත්වයකට පත් වේ. මේ අතරම පර්යේෂණ සාහිත්‍ය විමර්ශනය (litrature review) නිසි පරිදි සිදු නොවීමෙන් මාතෘකාවේ වලංගුතාව පිළිබඳ ගැටලු උද්ගත වේ (Cooper,1984, Marshall, 2006). ඇතැම් පර්යේෂකයින් තම පර්යේෂණය ලියා අවසන් කළත් ඒ පිළිබඳව වාචික පරීක්ෂණයේ දී (oral examination) පෙනී යන්නේ පර්යේෂණ මාතෘකාවේ ස්වභාවය, වලංගුතාව, ගැඹුර හා පසුබිම පිළිබඳ නිසි අවබෝධයක් නැති බවය.

කිසියම් පර්යේෂණ මාතෘකාවක් පර්යේෂකයාට මෙන් ම අන් අයට අපැහැදිලි වූ සංකීර්ණ එකක් වීමට බලපාන හේතු සාධක ද රාශියකි. එනම්, පෙර සාහිත්‍ය විමර්ශනය දුර්වල වීම, පර්යේෂණ දැනුම අඩුවීම, මාතෘකා පිටපත් කර ගැනීම, විමර්ශනශීලි හැකියාව අඩුවීම හා පර්යේෂණ මනස (research mind) දුර්වල වීම යන හේතු සාධකයි.

**පර්යේෂණ සාහිත්‍ය විමර්ශනය හා පර්යේෂණ මාතෘකාව**

පර්යේෂණ ගැටලුවක් අර්ථාන්විත වීමේ විද්‍යාත්මක පදනම වැටෙන්නේ විධිමත් සාහිත්‍ය විමර්ශනයක් (scientific literature review) අනුසාරයෙනි. මේ පිළිබඳව අදහස් දක්වන හාර්ට් (Hart, 1990) පෙන්වා දෙන්නේ පර්යේෂණ සාහිත්‍යය විමර්ශනය කිරීම පර්යේෂණ මාතෘකාවක් කරා යොමුවීමේ ප්‍රමුඛ භූමිකාවක් ඉටුකරන බවය. මෙහි

දී පර්යේෂකයා තෝරා ගන්නා ලද ගැටලුවට අදාළ පර්යේෂණ සාහිත්‍යය කියවීමෙන් පවතින දැනුමේ හිඩැස සම්බන්ධ ගැටලුව අර්ථපූර්ණ මාතෘකාවක් බවට පත්කළ හැකිය. එම නිසා පර්යේෂණ මාතෘකාවක 'උපත' නැත්නම් 'ස්වභාවය' සාහිත්‍ය විමර්ශනය යැයි කිවහැකි තරමට එය වැදගත් වේ.

එනම්, පර්යේෂණයට අදාළ සාහිත්‍ය විමර්ශනයට පෙර මාතෘකාව හඳුනා ගැනීම වැදගත් වේ. මේ පිළිබඳ අදහස් දක්වන ක්‍රෙස්වෙල් සාහිත්‍ය විමර්ශනය හා පර්යේෂණ මාතෘකාව අතර ඇති සම්බන්ධය මෙසේ පැහැදිලි කරයි.

"Before considering what literature to use in a project, first identity a topic to study and reflect on whether it is practical and useful to undertake the study. The topic is the subject or subject matter of a proposed study, such as "faculty teaching", organizational certainty" or psychological stress" Describe the topic in a few words or in a short phrase. The topic becomes the central idea to learn about or to explore. (Reswell, 2012:23)

මේ අනුව පැහැදිලි වන්නේ පර්යේෂණයක කේන්ද්‍රීය සාධකය පර්යේෂණ මාතෘකාව බවයි. පර්යේෂණ ගැටලුව නිවැරදිව නිර්මාණය කර ගැනීමට පර්යේෂණ සාහිත්‍ය විමර්ශනය කවර ආකාරයේ දායකත්වයක් ලබා දෙන්නේ දැයි තව දුරටත් පහත සඳහන් පරිදි පෙන්වාදිය හැකිය.

1. නවතම පර්යේෂණ ගැටලුවක් නිර්මාණය කර ගැනීමට අවශ්‍ය දැනුම සැපයීම.
2. පර්යේෂණ මාතෘකාවක් අවශ්‍ය සුවිශේෂී මඟපෙන්වීම්, ශිල්පීය ක්‍රම, න්‍යායාත්මක කරුණු අනාවරණය කරගත හැකිය. මෙහිදී මාතෘකාව සම්පූර්ණ තත්ත්වයකට පත් කිරීමට අවශ්‍ය මූලික කරුණු සියල්ලම පෙර සාහිත්‍ය විමර්ශනයෙන් සොයාගත හැකි වේ.
3. පර්යේෂණ ගැටලුවේ වැදගත්කම පිළිබඳ තර්කානුකූල සාක්ෂි සපයයි.

4. මෙතෙක් නොවිසඳී ඇති ගැටලුවකට අවශ්‍ය මගපෙන්වීම් කරයි.
5. පර්යේෂණ මාතෘකාව පිළිබඳ විශ්වසනීයතාව හා වලංගුතාව ඇතිකර ගැනීමට මග පෙන්වයි.
6. පර්යේෂණ ගැටලුව විසඳීමට අවශ්‍ය සංකල්ප හා න්‍යායයන් භාවිත කරන්නේ කෙසේ දැයි අවබෝධ කර ගත හැකිය.
7. පර්යේෂණ මාතෘකාව හා දැනට පවතින පර්යේෂණ දැනුම අතර සම්බන්ධය ශක්තිමත් කරයි (Malinowski, 1961:20).

මෙලෙස නවතම පර්යේෂකයෙකුට තම ගැටලුව අධ්‍යයනය කිරීමේ මාර්ග සිතියම සංරක්ෂණය කිරීමේ හැකියාව පෙර සාහිත්‍ය විමර්ශනයෙන් ලැබේ. මේ අනුව බොහෝ පර්යේෂණ ගැටලුවල ප්‍රභවය සාහිත්‍ය විමර්ශනය ලෙස හඳුන්වාදිය හැකිය.

**පර්යේෂණ මාතෘකාව යළි සිතා බැලීම**

පර්යේෂණ මාතෘකාවක් තෝරාගෙන එය සකස් කිරීම එතරම්ම ලෙහෙසි පහසු කාර්යයක් නොවේ. මෙහිදී පුස්තකාලය පරිහරණය කර පෙර සාහිත්‍ය විමසා බලා අන්තර්ජාලය උපයෝගී කරගෙන සැලකිය යුතු බුද්ධි කලම්බනකින් (brainstorming) මාතෘකාව තීරණය කිරීම පර්යේෂණ තෘප්තියට (research satisfaction) හේතු සාධක වේ. එහෙත් මෙම මාතෘකාව විද්වත් පර්යේෂණ මණ්ඩලයකින් අනුමත කරවාගත යුතුය. මේ සඳහා විද්‍යාත්මක ලෙස පර්යේෂණ යෝජනාවක් (research proposal) සකස් කළ යුතුය. මෙහි දී අපේක්ෂා කරන්නේ මාතෘකාවට අදාළ පර්යේෂණයට විද්‍යාත්මක ක්‍රියාවලියක් ඔස්සේ සහාය විය හැකිද? නැද්ද? එහි දී මතුවන ගැටලු මොනවාද? යන්න විද්වත් මණ්ඩලයක් සමඟ සාකච්ඡාවට භාජනය කිරීමයි.

ඉහත දක්වා ඇති පරිදි පර්යේෂකයා සිය පර්යේෂණ යෝජනාව සකස් කිරීම මතෘකාව (research topic) පදනම් කරගෙන සිදුවන බැවින් ඊට පෙර යළිත් පර්යේෂණ මාතෘකාව පිළිබඳව පහත සඳහන් කරුණු ඔස්සේ විමසා බැලීම වැදගත් වේ. එනම්,

1. මාතෘකාව මගින් අධ්‍යයනය කළ හැකි පර්යේෂණ ගැටලුවක් (researchable problem) නිරූපණය වේ ද?

2. පර්යේෂණ ගැටලුව විග්‍රහ කළ හැකි ද? (Wilkinson, 1991)
3. පර්යේෂණ ගැටලුව පිළිබඳ ප්‍රමාණවත් සාහිත්‍ය විමර්ශනයක් කර තිබේද යන ගැටලුව තෝරා ගැනීමේ හේතුව විග්‍රහ කළ හැකි ද? (Creswell,2009) පර්යේෂණ මාතෘකාව නිවැරදි වචන භාවිතයෙන් තර්කානුකූලව (ගැටලු ඇති නොවන පරිදි) නිවැරදිව, විද්‍යාත්මකව ලියා තිබේ ද?
4. පර්යේෂණ මාතෘකාව කවර ආකාරයෙන් පර්යේෂණ ක්ෂේත්‍රය තුළ වැදගත් වේ ද?
5. මාතෘකාව පවතින දැනුම් ක්ෂේත්‍රයේ (existing knowledge) හිඩැසක් පිරවීමට හැකියාවක් තිබේ ද?
6. පර්යේෂණ මාතෘකාව නියෝජනය කරන පර්යේෂණ භූමිය පර්යේෂණ ක්‍රියාවලියට කොතරම් ගැළපේ ද? නොගැළපේ ද?
7. පර්යේෂණයට අදාළ දත්ත ලබාගත හැකි ද? නොහැකි ද?
8. පර්යේෂණ මාතෘකාව අනුව පර්යේෂණයක් නිම කිරීමට කොතරම් කාලයක් ගතවේ ද? පිළිගත හැකි කාල රාමුවක් නිර්මාණය කළ හැකි ද?
9. පර්යේෂණ ගැටලුවට අදාළ දත්ත ලබා ගැනීමෙන් පසු ඒවා විශ්ලේෂණය කිරීමේ ක්‍රම ශිල්ප පිළිබඳ තමාට හැකියාවක් තිබේ ද? අවබෝධයක් තිබේ ද? පැහැදිලි කළ හැකි ද?
10. පර්යේෂණය සඳහා කොපමණ පිරිවැයක් දැරිය යුතුද? දැරිය හැකි ද?
11. මාතෘකාවේ මූලික සංකල්ප (key words) පිළිබඳ පැහැදිලි අවබෝධයක් තිබේද? (Locke et al.,2007)
12. උපදේශකවරයා පර්යේෂණ මාතෘකාව පිළිබඳ දැනුවත් කළා ද? එකඟ වූවාද? උපදෙස් ලබා දුන්නේද? අවබෝධ කරගත්තේ ද? රුචිකත්වයක් දක්වන්නේ ද?
13. පර්යේෂණ මාතෘකාවේ නීත්‍යනුකූලභාවයක් තිබේ ද? එනම්, රටේ පවතින පොදු නීතිරීතිවලට පටහැනිද? නැද්ද? යන්න
14. පර්යේෂණ මාතෘකාවට අදාළ පර්යේෂණ ආචාරධර්ම ආරක්ෂා කිරීමේ හැකියාවක් තිබේ ද?
15. පර්යේෂණ මාතෘකාවට අනුව පර්යේෂණයේ ප්‍රාමාණිකභාවය, අවකාශය කළමනාකරණය කර ගැනීමේ හැකියාවක් තිබේ ද?

ඉහත දක්වා ඇත්තේ පර්යේෂකයෙකු විසින් විද්‍යාත්මක පර්යේෂණ මාතෘකාවක් සැකසීමේ දී එය වඩාත් හොඳින් සාර්ථක කර ගැනීම සඳහා මාතෘකාව පිළිබඳ යළි විමසා බැලිය යුතු කරුණු කිහිපයකි. කිසියම් ආකාරයකින් ඉහත සඳහන් කරුණුවලින් එකක් හෝ කිහිපයක් දුර්වල තත්ත්වයක පැවතුණහොත්, එම මාතෘකාව ගැටලු සහගත තත්ත්වයට පත්වීමේ ඉඩකඩ වැඩිය. සමහර පර්යේෂකයින්ගේ ඉදිරිපත් කිරීම්වලින් (presentations) පර්යේෂණ මාතෘකා අනුමත නොවීමට ඉහත කරුණු කෙරෙහි අවධානය යොමු නොකිරීම හේතු සාධක වනු ඇත.

**පර්යේෂණ මාතෘකාවේ භාෂාව**

පර්යේෂණ මාතෘකාවක භාෂාව සරලව යෙදීම (The language of the research topic should have to be simple) බෙහෙවින් වැදගත් අවශ්‍යතාවකි. ඒ මක් නිසාද යත හොත් කිසියම් පර්යේෂණ මාතෘකාවක් තවත් අයෙකුට පහසුවෙන් අවබෝධ කරගත යුතු පරිදි තිබිය යුතු විමයි. එමෙන්ම මාතෘකාවේ බරපතල තාක්ෂණික වචන ඇතුළත් කළ යුතු නැත. අවශ්‍ය නම් පමණක් තේරුම්ගත හැකි පරිදි (Should use technical terms only when it is necessary) ඇතුළත් කළ හැකිය. එමෙන්ම කිසියම් අවස්ථාවක පර්යේෂණ මාතෘකාවේ ආචාරශීලි නොවන යෙදුම් හෝ වාක්‍ය ඇතුළත් කිරීමෙන් වැළකීම (Keep the ethics of writing in your mind to avoid any unethical terms of sentence) අත්‍යවශ්‍ය වේ. අනෙක් අතට පූර්ව නිගමන සහිත ප්‍රබල පක්ෂපාති නැඹුරුවක් ඇති වචන හා යෙදුම් සහිත භාෂාවක් භාවිත කිරීමෙන් වැළකීම ද බෙහෙවින් වැදගත් වේ. එමෙන් ම මාතෘකාව වඩා දීර්ඝවීම හා සංකීර්ණ වීමෙන් තොර තත්ත්වයකට පත් කිරීමකට උචිත භාෂාවක් යොදාගත යුතුය. ඒ අනුව පර්යේෂණ මාතෘකාවක භාෂාව සරලව යෙදීම ප්‍රබල අවශ්‍යතාවකි.

**පර්යේෂණ මාතෘකාවක ආචාරධර්මීය පදනම**

ඕනෑම පර්යේෂණ මාතෘකාවක් තෝරා ගැනීමේ දී ඒ සම්බන්ධ ආචාරධර්ම සැලකිල්ලට ගත යුතු වේ. එසේ නැතහොත් පර්යේෂණ මාතෘකාව පිළිබඳ ගැටලු ඇති වේ. මෙම ආචාර ධර්ම පිළිබඳ අවධානය

යොමු කිරීමේ දී (Ethical considerrations of research) පැහැදිලි වන්නේ යම් පර්යේෂණයක් සාර්ථක වීම සඳහා එය ප්‍රබල බලපෑමක් ඇති කරන බවයි. මේ පිළිබඳ අදහස් දක්වන ලිව් පෙන්වා දෙන්නේ පර්යේෂණ මාතෘකාවට ප්‍රවේශ වී සිටීමට (How do ethical issues enter into your selection of research problem) ආචාර ධර්මීය දැනුමක් අවශ්‍ය බවය (Hesse, Biber and Leary,2006). එම නිසා පර්යේෂණ මාතෘකාව තෝරා ගැනීමේ දී පර්යේෂකයා ඒ පිළිබඳව ආචාර්ය ධර්ම කවරේද යන්න පිළිබඳ අවබෝධයෙන් සිටීම වැදගත් වේ.

මෙහි දී ආචාරධර්ම යනුවෙන් අදහස් කරනුයේ පර්යේෂණ මාතෘකාවේ හිතකර ලක්ෂණ සියල්ල ආරක්ෂා කිරීමයි. ඒ අනුව කිසියම් පර්යේෂකයෙක් සිය පර්යේෂණ මාතෘකාව වඩාත් නිවැරදි සාධාරණ යුක්තිගරුක තත්වයට පත් කිරීම සම්බන්ධව ආචාර ධර්මීය වශයෙන් පහත සඳහන් කරුණු කෙරෙහි සැලකිලිමත්වීම වැදගත් වේ.

1. සිය පර්යේෂණ මාතෘකාව/ගැටලුව සෙසු අයට හානියක් නොවන පරිදි ගොඩනැගීම (Cavan,1977:810)
2. පර්යේෂණ මාතෘකාව සමාජ විරෝධී එකක් නොවීම
3. පර්යේෂණ මාතෘකාව වෙනත් පර්යේෂණයකින් පිටපත් කරන ලද (copy) එකක් නොවීම
4. පර්යේෂණ මාතෘකාව තමාගේ පර්යේෂණ ක්ෂේත්‍රයට හා අත්දැකීම් සම්භාරයට ගැළපීම
5. පර්යේෂණ මාතෘකාව තෝරා ගැනීම හා පර්යේෂණ අනාවරණ මින් ගැටලු සහගත තත්ත්වයක් උද්ගත නොවීම
6. පර්යේෂණ මාතෘකාව විවිධ පරිසර තත්ත්වයන්ට හානිකර නොවීම
7. පර්යේෂණ මාතෘකාව තුළ සැබෑ නම් ගම් සඳහන් කිරීම
8. පර්යේෂකයා තෝරා ගන්නා ලද මාතෘකාව මීට පෙර වෙනත් අය විසින් පර්යේෂණයට යොදාගෙන තිබීම හා පෙර සාහිත්‍ය පිළිබඳ අවබෝධයකින් තොරව තෝරා ගැනීම
9. පර්යේෂණ උපදේශකවරයාගේ උපදෙස් නොතකා මාතෘකාව හිතාමතා වෙනස් නොකිරීම

10. අනුමත කරන ලද පර්යේෂණ මාතෘකාවට වඩා වෙනස් මාතෘකාවක් පර්යේෂණයෙහි සඳහන් කිරීම
11. ප්‍රතිශෝධනය කරන ලද මාතෘකාවෙහි ඒවා නිසි පරිදි ඇතුළත් නොකිරීම
12. රටේ පවතින පොදු සිවිල් නීතියට පටහැනි මාතෘකාවක් තෝරා නොගැනීම
13. පර්යේෂණ මාතෘකාවෙන් කියවන්නන් ලබා ගන්නා අවබෝධය කුමක්ද? යන්න සිතා බැලීම (Maxwell, 2005( 86 - 42).

මේ අනුව පර්යේෂණ මාතෘකාවක් තෝරා ගැනීමේ දී ආචාරධර්ම ආරක්ෂා කිරීම පර්යේෂණයේ ගුණාත්මක තත්ත්වයට හේතු සාධක වන බව පෙනී යයි. පර්යේෂණ ආචාර ධර්ම (ethical considerations) පිළිබඳ අදහස් දක්වන පන්ච් (Punch, 2005 fyda (Hay,2006), සෙයිබර් (Sieber, 1998), බර්ග් (Berg: 2001), කේල (Kvale,2007) සහ පැටන් (Patton, 2002) යනාදී පර්යේෂකයින් පෙන්වා දෙන්නේ මෙම ආචාර ධර්මවල බලපෑම හුදෙක් මාතෘකාවට පමණක් නොව දත්ත එකතු කිරීමේ සිට (The ethical issues do not stop with selection of the topic and data collection) අවසානය දක්වා සියලු ම කාර්යයන්ට ඍජු බලපෑමක් ඇති කරන බවය. එම නිසා කවර ක්ෂේත්‍රයක් ඔස්සේ මාතෘකාවක් තෝරා ගත්තත් එහි ආචාර ධර්මීය පදනම විමසා බැලීම වැදගත් අවශ්‍යතාවයකි.

මෙම ලිපියේ දී අවධානය යොමු කළ යුතු තවත් ඉතාම වැදගත් කරුණු කිහිපයක් වේ. එයින් පළමුවැන්න නම් කිසියම් පර්යේෂකයෙකුට පර්යේෂණ මාතෘකාවක් සිතට වැටෙන ස්ථිර ක්‍රමයක් තිබේද යන්නයි. මේ පිළිබඳව අදහස් දක්වන රත්නපාල (1995:33) පෙන්වා දෙන්නේ පර්යේෂණ මාතෘකාවක් සිතට වැටෙන ස්ථිර තැනක් හෝ ක්‍රමයක් නොමැති බවයි. මෙය වඩාත් සරලව දක්වුවහොත් පර්යේෂකයෙකුට තමන් පාරේ යනවිට, බසයේ ගමන් කරනවිට, නින්දේ සිටින විට ඉතා ඵලදායී මාතෘකා සිතට පැමිණිය හැකිය. තමාගේ වැඩපලේ දී වැඩක නිරතව සිටිය දී, විවේකයෙන් සිටිය දී, පර්යේෂණ ගැටලු මතුවිය හැකිය. මෙහි දී එවැනි මාතෘකා ක්ෂේත්‍ර සටහන් පොතක (Field book) සඳහන් කර ගැනීම වැදගත්

වේ. මේ අතර බොහෝ දෙනෙකුට පර්යේෂණ මාතෘකාවක් තනිව තෝරා ගැනීමට තරම් පෙළඹීමක් හා ධෛර්යයක් ඇති නොවේ. එවැනි අවස්ථාවක දී තමා පර්යේෂණය සිදුකිරීමට අපේක්ෂා කරන විෂය ක්ෂේත්‍රය පිළිබඳ සිතේ විග්‍රයක් සමග වැඩිදුරටත් සාකච්ඡා කළ යුතුයි. එවිට වඩාත් සුදුසු මාතෘකාවක් මතුකර ගැනීමේ හැකියාවක් ඇත. එසේම මීට පෙර කර ඇති පර්යේෂණ ඔස්සේ නව මාතෘකාවක් සකස්කර ගැනීමට පිළිවන. මෙලෙසම යම් පර්යේෂකයෙකුට මීට පෙර තමන් විසින්ම කර තිබෙන මාතෘකාවක් තව දුරටත් සංවර්ධනය කළ හැකියි. මේ අතර තිබෙන මාතෘකාවක් පර්යේෂකයාගේ උනන්දුව සහිත විෂය ක්ෂේත්‍රයක් බවට පත් කිරීමෙන් මාතෘවක් නිර්මාණය කරගත හැකියි. කෙසේ හෝ පර්යේෂකයා නිරන්තරයෙන් මාතෘකාව ගැන සිතීමෙන් උසස් මාතෘකාවක් ගොඩනගා ගත හැකිය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


ජයසේන, අශෝකා (2015). **පර්යේෂණ ක්‍රම විද්‍යා ප්‍රවේශය**. කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ධම්මපාල හිමි, ගතාරේ (1998). **පර්යේෂණ ක්‍රම විද්‍යාව**. නුගේගොඩ: පියසිරි ප්‍රින්ටින්.

පරමානන්ද හිමි, පොල්ගස් වත්තේ (2016). **පර්යේෂණ නිබන්ධන අත්පොත**. කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

රත්නපාල, නන්නදසේන (1995). **සමාජ විද්‍යා පර්යේෂණ මූලධර්ම**. වරකාපොල ලලිලතධීර, කේ.ඒ. (2018). පර්යේෂණ ක්‍රමවේදය හා ක්‍රම. මහරගම: එල්.එම්.සී.ප්‍රකාශකයෝ,

Berh, B.L.(2001). **Qualitative Research Methods for the Social Science**. (7th ed) Boston: Allyn Bacon

Caven, S.(1977). Review of J.D.Douglas's(1976). **Investigative Social Review**: Individual and Team Field Research The American Journal of Sociology 83(3),809-11

Cooper, H.(1984).**The Integrative Reseach Review**: Asystematic approach. Beverly Hilis, CA:sage

Creswell, J.W.(2007). **Qualitative Inguiry and Research Design** (2nd Edi) CA.Thousend Okas,Saga Publication

Hesse-Bibber.Sov,& Leavy, P.(2006).**The Picture of Qualitative**

**Research**.Thousnd oaks,CA: Saga.

Kerlinger,F.N.(1979).**BehavioralResearch:AConceptnalApproach**. New York: Holt, Rinehart & Winston

Kvale,s(2007).**Doing Interviews. In u. Flick** (Ed),The saga qualitative research kit,London: Saga.

Malinowski, B. (1922). **Agronauts of the Western Pacific**. New York.E.P.Dutton

Maxwell, J.A (2005). **Gualitative Research Design**: An Interactive Approach ( 2nd ed.)Thousend oaks,C.A:Sage

Mouly,G.J.(1978). **Educational Reasearch**: The Art and Science of Investigation. Boston allyn & Bacon

Patton.M.g.(2002). **Qualitative Research and Evalunation Methods** (3rd ed) Thousand Oaks,CA:Sage.

Siber, J. E (1998). **Planning Ethically Responsible Research In**. L.Bickman q.d.j.Roh (eds Home book of applied social research methods (pp.127-156) thousand oaks.CA: Sage.